# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.18 පැය 0600 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 766 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර.**

2025.04.17 වන දින සවස් කාලයේ බොරැල්ල පොලිස් වසමේ හරස් පාර ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 95 මිලි ග්‍රෑම් 360 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන බොරැල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 48 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බොරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.**

2025.04.17 වන දින උදෑසන කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ මහජන මාවත ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 100 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 40 ක් වන අතුරුගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමග යොමු කරමි.

**03. ජීව උණ්ඩ හා තියුණු ආයුධයක් සොයා ගැනීම - අතුරුගිරිය පොලිස් ස්ථානය.**

2025.04.12 වන දින අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 100ක් සමග අත්අඩංගුවට ගත් සැකකරුවෙකු රඳවා තබා ගැනීමේ නියෝග යටතේ රඳවාගෙන සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වූ තොරතුරු මත 2025.04.17 වන දින, ටී56 අවි සඳහා යොදන ජීව උණ්ඩ 50ක් හා තියුණු ආයුධයක් පොලිස් භාරයට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 25 ක් වන අතුරුගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.වැටලීමට අදාල ජායාරූපයක් මේ සමග යොමු කරමි.

## 04. ගංජා මිශ්‍ර මදන මෝදක සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.

2025.04.17 වන දින සවස් කාලයේ ඇතිමලේ පොලිස් වසමේ ගැමුණුපුර ප්‍රදේශයේදී ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ගංජා මිශ්‍ර මදන මෝදක ගුලි ග්‍රෑම් 600 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 61 ක් වන ගැමුණුපුර, ඇතිමලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි. වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

## 05. සැකකටයුතු මරණයක් - ආණමඩුව පොලිස් ස්ථානය.

2025.04.17 වන දින රාත්‍රී කාලයේ ආණමඩුව පොලිස් වසමේ කොට්ටුකච්චිය ප්‍රදේශයේ පුද්ගලයෙකු යතුරුපැදියකින් ගමන් කරමින් සිටියදී රිය අනතුරකට ලක්ව ආණමඩුව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවටත්, 2025.04.15 වන දින ප්‍රදේශයේ වෙළඳසැලක් අසලදී මරණකරුට එම ප්‍රදේශයේම පුද්ගලයින් දෙදෙනෙකු විසින් පහරදීමක් සිදු කර ඇති බැවින් මෙම මරණය සැකසහිත බවටත් ආණමඩුව පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 25 ක් වූ කොට්ටුකච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ආණමඩුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මෙය රිය අනතුරකින් සිදුවූ මරණයක්ද නැතහොත් මනුෂ්‍ය ඝාතනයක්ද යන්න සම්බන්ධයෙන් අනාවරණය කර ගැනීම සඳහා ආණමඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - මිහින්තලය පොලිස් වසම.

2025.04.17 වන දින සවස් කාලයේ මිහින්තලය පොලිස් වසමේ පුත්තලම ත්‍රිකුණාමලය මාර්ගයේ අඹගහවෙල ප්‍රදේශයේදී මිහින්තලය දෙස සිට කහටගස්දිගිලිය දෙසට ධාවනය වූ වෑන් රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ රියදුරු, ඉදිරි අසුනේ ගමන් කල රියදුරුගේ පියා, වෑන් රථයේ පිටුපස ගමන් කල රියදුරුගේ බිරිඳ හා තවත් ඥාති කාන්තාවක් ප්‍රතිකාර සඳහා තම්මැන්නෑව රෝහලට ඇතුලත් කිරීමේදී රියදුරුගේ පියා මියගොස් ඇත. අනෙක් තුවාලකරුවන් වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහල වෙත මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 85 ක් වූ මාස්පොත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තම්මැන්නෑව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මිහින්තලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - අනුරාධපුරය පොලිස් වසම.

2025.04.17 වන දින රාත්‍රී කාලයේ අනුරාධපුරය පොලිස් වසමේ ඒ-28 මාර්ගයේ ශ්‍රාවස්තිපුර ප්‍රදේශයේදී අනුරාධපුර දෙස සිට තලාව දෙසට ධාවනය වූ ලොරි රථයක ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් එකිනෙක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු අනුරාධපුර රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 35 ක් වූ තලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුරය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**